# නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී එල් සී - මූලික විස්තර පත්‍රිකාව

**හිතවත් ගනුදෙනුකාර භවතුන් වෙත,**

**ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිකුත් කරන ලද ගනුදෙනුකාර ප්‍රඥප්තිය යටතේ ඇති අවශ්‍යතාවයකට අනුව අප විසින් මූලික විස්තර පත්‍රිකා මාලාවක් පිළියෙල කරනු ලැබ ඇත. අප පිරිනමන බැංකුකරණ නිපැයුම්/සේවාවන් අතරින් ඔබට අවශ්‍ය වන හා ඔබට අදාළ වන ඒවා තෝරා ගැනීමට එම මූලික විස්තර පත්‍රිකා ඔබට උපකාරී වනු ඇත.**

**නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී වෙතින් ලබා ගත හැකි ක්‍රෙඩිට් කාඩ්පත් පහසුකම් සහ සේවාවන් පිළිබඳ පුළුල් විස්තරයක් මෙම මූලික විස්තර පත්‍රිකා මගින් ඔබට ලැබෙනු ඇත. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීමට ඔබ අපේක්ෂා කරන්නේනම් කරුණාකර පහත දැක්වෙන ආකාරයට අප හා සම්බන්ධ වන්න.**

| | |
|---|---|
| **දුරකථන /ෆැක්ස්** | **පැය 24 පුරා ක්‍රියාත්මක පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංක ඔස්සේ කරුණාකර අප අමතන්න.**<br>**ඇමෙරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා (011)4414141 / මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා (011)4414155 හා ෆැක්ස් සඳහා (011)4414142 භාවිතා කරන්න.** |
| **විද්‍යුත් තැපෑල** | **ඇමෙරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා** americanexpress@nationstrust.com / **මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා** creditcards@nationstrust.com |
| **වෙබ් අඩවිය** | www.nationstrust.com /**ඇමෙරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ් සඳහා පමණක්** www.americanexpress.lk **භාවිතා කරන්න.** |
| **තැපැල්** | **කළමනාකරු - සේවා ගුණාත්මකතා**<br>**නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල් සි**-PO 118<br>**ක්‍රෙඩිට් කාඩ්පත් මධ්‍යස්ථානය, 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.** |

**ඔබට ක්‍රෙඩිට් කාඩ්පත් සම්බන්ධ යම් පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර එම පැමිණිල්ල පිළිබඳ දැන්වීමක් ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් ඉහත සඳහන් ලිපිනය හරහා අප වෙත ඉදිරිපත් කරන්න. නැතහොත් ඉහත සඳහන් දුරකථන අංක ඔස්සේ අප අමතන්න. අප කාර්යාල දින 3ක කාලයක් ඇතුලත ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.**

## විස්තරය - ක්‍රෙඩිට් කාඩ්පත් (ණයවර කාඩ්පත්)

### ක්‍රෙඩිට් කාඩ්පතක් යනු කුමක්ද?
ක්‍රෙඩිට් කාඩ්පතක් යනු ගෙවීම් ක්‍රමයක් ලෙස යොදා ගැනීම සඳහා භාවිතා කරන්නන්ට නිකුත් කරනු ලබන ප්ලාස්ටික් කාඩ් පතකි. මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවන් වලට පසු දිනක මුදල් ගෙවීමේ පදනම මත (ණයට) භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීමට එමගින් ඉඩ සැලසෙයි.

එක් එක් කාඩ්පතක ණය සීමාව බැංකුව විසින් කලින් නියම කරනු ලැබ ඇත. මුළු මුදල හෝ ගෙවීමට නියමිත අවම මුදල තෝරා ගැනීමේ හැකියාව ගනුදෙනුකරුට ඇත. ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා හීනවන ශේෂ ක්‍රමය යටතේ පොලිය අය කරනු ලබයි.

### අතිරේක ක්‍රෙඩිට් කාඩ්පත්
අතිරේක ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කරනු ලබන්නේ මූලික කාඩ්පත් සාමාජිකයාගේ සමීපතම පවුලේ සාමාජිකයන් හා මූලික කාඩ්පත් සාමාජිකයා විසින් නිර්දේශ කරන ලද පුද්ගලයන් සඳහා පමණක් වන අතර මූලික කාඩ්පතේ ණය සීමාව අතිරේක කාඩ්පත් අතරද බෙදී යයි. කාඩ්පත මගින් සිදු කරන ගනුදෙනු සහ අයකරන ගාස්තු සඳහා එක් එක් අතිරේක කාඩ්පත් සාමාජිකයා තනි තනිව හෝ මූලික කාඩ්පත් සාමාජිකයා සමග ඒකාබද්ධව හෝ වගකීම දරයි. අතිරේක කාඩ්පත් වලට අදාල සියලු ක්‍රියාමාර්ග මූලික කාඩ්පත් සාමාජිකයාගේ ඉල්ලීම මත පමණක් සිදු කරනු ලැබේ.

### ඇමෙරිකන් එක්ස්ප්‍රස් කාඩ්පත් යටතේ ඇති නිෂ්පාදන මාලාව
- ඇමෙරිකන් එක්ස්ප්‍රස් ප්ලැටිනම් ක්‍රෙඩිට් කාඩ්පත
- ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ප්ලැටිනම් ඇමෙරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත
- ඇමෙරිකන් එක්ස්ප්‍රස් ගෝල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත
- ඇමෙරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත
- ඇමෙරිකන් එක්ස්ප්‍රස් කෝපරේට් ගෝල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත
- ඇමෙරිකන් එක්ස්ප්‍රස් කෝපරේට් ග්‍රීන් ක්‍රෙඩිට් කාඩ්පත

### මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් යටතේ ඇති නිෂ්පාදන මාලාව
- ප්ලැටිනම් මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත
- වර්ල්ඩ් මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත (සැෆයර් වර්ල්ඩ් මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත හා රූබි වර්ල්ඩ් මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත)

### ගනුදෙනුකරුවන්ට ලැබෙන දිරි දීමනා / ප්‍රවර්ධන ඇතළු ප්‍රතිලාභ
- ණය පදනම යටතේ ලොව පුරා භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීම.
- ක්‍රෙඩිට් කාඩ්පතක් යොදා ගනිමින් මුදල් ලබා ගැනීමේ හැකියාව.
- පැය 24 පුරාම ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය සහ හදිසි අවස්ථා සහාය.
- ඉල්ලා සිටිනු ලැබූ විට විද්‍යුත් තැපැල් මගින් බැංකු ප්‍රකාශ නිකුත් කිරීම.
- අන්තර්ජාලය ඔස්සේ ක්‍රෙඩිට් කාඩ් බිල්පත් පියවීමේ හැකියාව.
- තෝරාගත් වෙළඳ ස්ථාන වලින් පොලී රහිත වාරික ගෙවීම් සැලසුම.
- ව්‍යාපාරික කාඩ්පත් හැර අනෙක් කාඩ්පත් සඳහා ප්‍රසාද ලකුණු පිරිනැමීමේ සැලසුම්(පිරිනැමෙන සැලසුම් කාඩ්පතට අනුකූලව වෙනස් විය හැක.)

## ගනුදෙනුකරුවන්ගෙන් අය කරන ගාස්තු/ අයකිරීම්/කොමිස්/පොලිය

### ණය කාලසීමාව සහ පොලිය අයකිරීම
කාඩ්පත උපයෝගි කරමින් සිදුකරනු ලබන මිලදී ගැනීම් සඳහා කාඩ්පත් හිමියෙකුට අවම දින 20ක සහ උපරිම දින 50ක කාලයක් සඳහා ණය පහසුකම් හිමි වේ.
කාඩ්පත් හිමියා විසින් ගෙවීමට ඇති මුළු මුදල නියමිත දිනයේ හෝ ඊට පෙර ගෙවනු ලැබුවහොත් එම කාලය සඳහා එම කාඩ්පත් ගිණුමට කිසිදු පොලියක් අය නොකෙරෙනු ඇත.

අවම ගෙවීම පමණක් කරන්නේනම් පොලිය අය කරනු ඇත.

පොලිය ගණනය කිරීමට යොදා ගන්නා සූත්‍රය = ප්‍රාග්ධන වටිනාකම x පොලී අනුපාතය x (දින ගණන/365)

හීන වන ශේෂ ක්‍රමය මත පොලිය දිනපතා ගණනය කරනු ලැබේ.

ප්‍රකාශයේ ගිණුම්ගත දිනය යටතේ දැක්වෙන දිනය එක් ගනුදෙනුවක පොලිය ගණනය සඳහා ආරම්භක දිනය ලෙස සැලකෙනු ඇත.

### කාඩ්පත් ගාස්තු
* සම්බන්ධක ගාස්තුව - එක් වරක් පමණක් ගෙවනු ලබන ගාස්තුවකි.

* වාර්ෂික ගාස්තුව - වාර්ෂිකව අය කෙරේ.

### දඩ ගාස්තු
* ණය සීමාව ඉක්මවීමේ ගාස්තු - නියමිත ණය සීමාව ඉක්මවුවහොත් අය කෙරේ.

* ප්‍රමාද වී ගෙවීම් ගාස්තුව - අවම ගෙවීම නියමිත දිනයේ දි නොගෙවුවහොත් අය කෙරේ.

### මූල්‍ය ගාස්තු
* මුදල් අත්තිකාරම් ගාස්තු - මුදල් අත්තිකාරම් ලබා ගන්නා සෑම අවස්ථාවකදීම අය කෙරේ.

රාජ්‍ය ගාස්තු සියල්ලක්ම (මුද්දර ගාස්තු ඇතුලුව) යෝග්‍ය ලෙස අයකරනු ලැබේ.

### ගිණුම් නඩත්තු ගාස්තු
කාඩ්පත් සඳහා අදාළ වන ගිණුම් නඩත්තු ගාස්තු සම්පූර්ණ ලැයිස්තුව සඳහා මෙම මාර්ග භාවිතා කරන්න.
* ඇමෙරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා www.americanexpress.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

* මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා www.nationstrust.com වෙබ් අඩවියට පිවිසෙන්න.

## නිෂ්පාදනය/සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.

### අවශ්‍ය සුදුසුකම් සහ ලිපි ලේඛන
අයැදුම්කරු අවම වශයෙන් අවුරුදු 18 ක් විය යුතුය.

### රැකියාවක් කරන්නේ නම්
- ක්‍රෙඩිට් කාඩ් ඉල්ලුම්පත් පෝරමය
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්
- වැටුප් පත්‍රිකාව
- වැටුප සහතික කරමින් සේවාදායකයාගෙන් ලිපියක්
- පදිංචි ලිපිනය සනාථ කරන බිල්පත් (උදා ඃ ස්ථාවර දුරකථන, ජල හෝ විදුලි බිල්පත්)

### ස්වයං රැකියාවක් කරන්නේ නම්
- ක්‍රෙඩිට් කාඩ් ඉල්ලුම්පත් පෝරමය
- ජාතික හැඳුනුම්පතේ / විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය / 20 පෝරමය (සීමිත වගකීම් සමාගමක් නම්)
- පසුගිය වසර 02 සඳහා බදු ප්‍රතිලාභ
- පසුගිය වසර 02 සඳහා ආදායම් සහතික කරමින් විගණක වෙතින් ලිපියක්
- පසුගිය මාස 03 සඳහා බැංකු ප්‍රකාශයක් (සමාගමේ සහ පුද්ගලික)
- අදාල වන්නේ නම් වෙනත් ආදායම් පිළිබඳ සාධක
- පදිංචි ලිපිනය සනාථ කරන බිල්පත් (උදා ඃ ස්ථාවර දුරකථන, ජල හෝ විදුලි බිල්පත්)

ගනුදෙනුකරුවා බැංකුව සමඟ ක්‍රෙඩිට් කාඩ් භාවිතය පිළිබඳ නීති රීති හා කොන්දේසි දක්වන ලිඛිත ගිවිසුමකට එළැඹිය යුතුය.

### කාර්ය පටිපාටිය
1 අපගේ ඕනෑම ශාඛාවකින් ඉල්ලුම්පත් පෝරමයක් ලබා ගන්න.

2 සම්පූර්ණ කළ පෝරමය කරුණාකර ඔබට ලඟම නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට බාර දෙන්න. නැතහොත් පහත ලිපිනයට තැපැල් කරන්න.

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී එල් සී - PQ 118
256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

3 ඇමෙරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා පමණක් ඔබට අන්තර්ජාලය ඔස්සේ www.americanexpress.lk මගින්ද ඉල්ලුම් කල හැකිය.

## මූලික නීතිරීති සහ කොන්දේසි
නීතිරීති සහ කොන්දේසි තුල පහත සඳහන් කරුණු ද සමග තවත් දේ ඇතුළත් වේ.

### කාඩ්පත භාවිතය
මෙම කාඩ්පත ලොව පුරා වලංගුය. කෙසේ වුවද කාඩ්පත් සාමාජිකයා (හිමියා) එය වාණිජමය/ව්‍යාපාර කටයුතු සඳහා යොදා නොගත යුතුය. කාඩ්පත පුද්ගලික අවශ්‍යතා සඳහා පමණක් භාවිතා කළ යුතුය. කාඩ්පත් සාමාජිකයා සැමවිටම සිය පුද්ගලික හැඳුනුම් රහස්‍ය අංකය(PIN) රහසිගතව සහ කාඩ්පතින් බැහැරව තබා ගත යුතුය. කාඩ්පතක් අස්ථානගත වීම හෝ සොරකම් කරනු ලැබීම පිළිබඳව බැංකුවේ ශ්‍රී ලංකාවෙහි කාඩ්පත් මධ්‍යස්ථානයට දැනුම් දෙන තුරු එය භාවිතා කරමින් සිදු කෙරෙන සියලු ගනුදෙනු සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතුය.

### මුදල් අත්තිකාරම්
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) වලින් හෝ බැංකු ශාඛා වලින් හෝ මුදල් ලබා දෙන වෙළෙඳුන්ගෙන් (යන්ත්‍ර/නියෝජිතයන් වෙතින් ) නියමිත මුදල් සීමාව දක්වා මුදල් අත්තිකාරම් ලබා ගැනීමේ දී ඒ ඒ ස්ථාන වල හෝ පුද්ගලයින්ගේ සීමාවන් සහ පාලනයන් වලට කාඩ්පත් සාමාජිකයා යටත්වනු ඇත.

### ණය සීමාව
කාඩ්පත සමග ලබා දෙන ආවරණ ලිපියේ මෙන්ම මාසික කාඩ්පත් ප්‍රකාශයේ ද කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමට අදළ වන මූලික ණය සීමාව දැක්වෙනු ඇත. බැංකුව විසින් ණය සීමාව තීරණය කොට එය මාසික කාඩ්පත් ප්‍රකාශය හෝ ලිපියක් මගින් කලින් කලට කාඩ්පත් හිමියාට දැනුම් දෙනු ඇත.

### ගෙවීම
මාසික කාඩ්පත් ප්‍රකාශය ලැබුණු විට කාඩ්පත් සාමාජිකයා යටත් පිරිසෙයින් මාසික කාඩ්පත් ප්‍රකාශයේ සඳහන් වන "ගෙවිය යුතු අවම මුදල" බැංකුවට ගෙවිය යුතුය. එක් එක් අතිරේක කාඩ්පත් සාමාජිකයා මූලික සාමාජිකයා සමග ඒකාබද්ධව හෝ තනි තනිව හෝ බැංකුවට මුදල් ගෙවීමේ වගකීම දරයි. ගෙවීමට නියමිත දිනය නිවාඩු දිනයක් වූවහොත් කාඩ්පත් සාමාජිකයා ඊට පෙර ඇති වැඩ කරන දිනයේ දී ගෙවීම කළ යුතුය.
ගෙවීමේ ක්‍රම මාසික කාඩ්පත් ප්‍රකාශයේ පසුපිටෙහි සඳහන් කර ඇත.

### ණය අය කරවා ගැනීම්
ගෙවීම් පැහැර හරින මුල් මාස 3 දී ලිපි, දුරකථන ඇමතුම්, කෙටි පණිවිඩ හා අවශ්‍ය වුවහොත් ගනුදෙනුකරු හමු වී ගෙවීම් කරන ලෙස ඉල්ලීම් යොමු කරනු ලැබේ. බැංකුව හට ගනුදෙනුකරු සම්බන්ධකරගත නොහැකි විටක දී නිර්දේශකයින් අමතනු ලැබේ.
ඉහත උත්සහයන් අසාර්ථක වූ විටක දී හා ගෙවීම් පැහැර හැර මාස 4ක් වන විට දී බැංකුව විසින් අවශ්‍ය විට සම්බන්ධ කරගන්නාවූ පදනම මත භාවිතා කරන්නාවූ ණය එක් රැස් කිරීමේ නියෝජිතයෙකු හට එම ගිණුම පවරණු ලැබේ. එපමණක් නොව බැංකුවේ අයිතිවාසිකම් ප්‍රකාරව ණය අය කරවා ගැනීම සඳහා කාඩ්පත් සාමාජිකයා හට මෙන්ම පරිපූරක කාඩ්පත් සාමාජිකයන්ට (ඇතහොත්) විරුද්ධව නීතිමය පිලිවෙත් භාවිතා කරනු ලැබේ.

රාජ්‍ය රෙගුලාසි වලට අනුකූලව මූල්‍ය ආයතන සියල්ලකම නිර්දේශනය සඳහා ශ්‍රී ලංකා ණයවර තොරතුරු කාර්යාංශය (Credit Information Bureau of Sri Lanka - CRIB) හට ක්‍රෙඩිට් කාඩ්පත් ණය හා ගෙවුම් හිඟ වටිනාකම් කලින් කලට වාර්තා කරනු ලැබේ.